Australian Government
Department of Human Services

# Status Resolution Support Services (SRSS)
## ගෙවීම—ඔබේ ආදායම වාර්තා කිරීම

ඔබ හෝ ඔබේ සහකරු රැකියාවක් කිරීම ආරම්භ කර ඇත්නම් **වහාම** අපට දැනුම් දිය යුතුය. ඒ ඔබ සහ ඔබේ සහකරු උපයන දේ ඔබේ SRSS ගෙවීම්වලට බලපාන නිසාය.

ඔබට නිවැරදි මුදල ගෙවීමට ඔබ සෑම දෙසතියකටම වරක් උපයන ප්‍රමාණය අප දැනගත යුතුය. ඔබට SRSS මුදල් වැඩිපුර ගෙවූ ඇත්නම් ඔබට එම මුදල් ආපසු ගෙවීමට සිදු වනු ඇත.

**මම වාර්තා කළ යුත්තේ කුමක්ද?**
රැකියාවෙන් ලැබෙන ආදායම:

- ලෙඩ ගෙවීම්, රැකබලා ගන්නන්ගේ නිවාඩු හෝ නිවාඩු ගෙවීම්ද ඇතුළුව වැටුපෙන්, වේතනයෙන් සහ/හෝ කොමිස්වලින් ලැබන දළ ආදායම.

වෙනත් ප්‍රභවයන්ගෙන් ලැබෙන ආදායම්:

- නිතර ලැබෙන ත්‍යාග හෝ දීමනා
- මියගිය අයකුගේ බූදලයෙන් ලැබෙන ආදායම
- අසනීප හෝ හදිසි අනතුරු රක්ෂණය.

**අප දැන ගත යුත්තේ මොනවාද?**
ඔබේ සහ ඔබේ සහකරුගේ ආදායම වාර්තා කිරීමේදී අප පහත දේ දැන ගත යුතුය:

- දළ ආදායම් ප්‍රමාණය—වාර්තා කිරීමේ කාල සීමාව තුළ බදු අය කිරීමට ප්‍රථම උපයා ගත් ආදායම (දින 14ක්)
- ඔබේ සේවා යෝජකයාගේ විස්තර—ඔහුගේ ව්‍යාපාරික නම, ලිපිනය, දුරකථන අංකය, සහ දන්නේ නම් Australian Business Number (ABN) ඇතුළු විස්තර. ඔබේ සේවා යෝජකයාගේ ABN එක ඔබේ පඩිපතේ තිබේ. නැත්නම් ඔබේ සේවා යෝජකයාගෙන් අසා දැනගත හැක
- ඔබ රැකියාව කිරීම ආරම්භ කළ දිනය.

තවමත් ඔබේ සේවා යෝජකයා ගෙවීම් කර නැති වුවද පළමු සහ අවසාන දිනද ඇතුළුව ඔබේ සහකරුගේ ආදායම ඔබ වාර්තා කරන මුළු දින 14ක් වූ කාල සීමාව සඳහාම සඳහන් කළ යුතුය. සෑම අයකුම එකම දිනයේ වාර්තා කිරීම් නොකරන හෙයින් සමහර ගනුදෙනුකරුවන්ගේ වාර්තාකරණ කාලය ඔබේ කාල සීමාවට වඩා වෙනස් විය හැක.

**මම වාර්තා කළ යුත්තේ කවදාද?**
ඔබ හෝ ඔබේ සහකරුට රැකියාවක් ලැබුනොත්, රැකියාව නතර වුවහොත් හෝ ආදායම වෙනස් වුවහොත් ඔබ **වහාම** අපට ඒ බව කිව යුතුය.

ඔබ වැඩ කිරීම ආරම්භ කළ පසු සෑම දෙසතියකට වරක්ම ඔබේ SRSS ගෙවීම් දිනයට පෙර දින ඔබේ ආදායම වාර්තා කළ යුතුය.

**මගේ ආදායම වාර්තා කරන්නේ කෙසේද?**
දුරකථනයෙන්:

- ඔබේ SRSS ගෙවීම් දිනයට පෙර **131 202** අමතා ඔබෙ භාෂාව ඇසූ විට “SRSS” **යැයි කියන්න.** මෙම අංකය ඇමතීමෙන් ඔබේ භාෂාව කතා කරන අයකුට කතා කළ හැක.

පුද්ගලිකව:

- SRSS දිනට පෙර දින ඔබට Income Reporting Statement ආකෘති පත්‍රයක් පුරවා එය ගොනු කළ හැක. මෙය සේවා මධ්‍යස්ථානයකට යාමෙන් හෝ සේවා නිලධාරියකු හා කතා කිරීමෙන් කළ හැක. බොහෝ සේවා මධ්‍යස්ථානවල භාෂණ පරිවර්තකයන්, භාෂා දෙකක් කතා කළ හැකි කාර්ය මණ්ඩලයක් ඇත. නැත්නම් දුරකථනය මගින් කතා කරන භාෂණ පරිවර්තකයකුද ලබා ගත හැක.

**මම ස්වයං රැකියාවක් කරන්නේ නම් කළ යුත්තේ කුමක්ද?**

- ඔබ Business Details ආකෘති පත්‍රයක් (MOD F) සම්පූර්ණ කර ආපසු භාර දිය යුතු වනු ඇත.
- ගණකාධිකාරීවරයකු මගින් හෝ Profit and Loss Statement ආකෘති පත්‍රයක් (SU580) පිරවීමෙන් මාස තුනක් සහා ලාභ සහ පාඩු සඳහා වන ඇස්තමේන්තුවක් සැපයයිය යුතුය.
- අපි ඔබේ ලාභය සහ පාඩුව තක්සේරු කරන අතර දෙසතියක් සඳහා ඔබේ සාමාන්‍ය ලාභය ගණනය කරමු.
- සම්පූර්ණ ව්‍යාපාරික මුදල් වර්ෂයම නියෝජනය වන පරිදි ආදායම් බදු ලේඛන ඔබට ලැබෙන තෙක් අපි ඔබේ ලාභය සහ පාඩුව සෑම මාස තුනකට වරක්ම තක්සේරු කරමු.

**ඔබේ ආදායම වාර්තා කළ හැක්කේ කාටද?**

- ඔබට හෝ ඔබේ සහකරුට.
- ඔබ වෙනුවෙන් අපව සම්බන්ධ කර ගත හැකි ඔබට සේවා සපයන අයකු වැනි වෙනත් පුද්ගලයකුට.

වැඩිපුර ගෙවීම වළක්වා ගැනීම සඳහා සෑම දෙසතියකටම වරක් ඔබේ ඉපැයීම් නිවැරදිව වාර්තා කිරීම ඔබේ වගකීම වන බව **මතක තබා ගන්න.**

## වැඩිදුර විස්තර සඳහා

- ඉංග්‍රීසියෙන් වැඩිදුර විස්තර සඳහා **humanservices.gov.au/srss** වෙත යන්න
- ඔබේ භාෂාවෙන් තොරතුරු කියවීමට, ඇසීමට හෝ වීඩියෝ බැලීමට **humanservices.gov.au/yourlanguage** වෙත යන්න.
- Centrelink ගෙවීම් සහ සේවා පිළිබඳ ඔබේ භාෂාවෙන් අප හා කතා කිරීමට අංක **131 202 අමතන්න.**
- Medicare සහ Child Support ගෙවීම් සහ සේවාවන් සඳහා ඔබේ භාෂාවෙන් අපට කතා කිරීමටTranslating and Interpreting Service (TIS National) අංක **131 450** ට අමතන්න.
- සේවා මධ්‍යස්ථානයක් වෙත යන්න.

සටහන: ඕස්ට්‍රේලියාවේ ඕනෑම තැනකට අංක '13' ඔබේ නිවසේ දුරකථනයෙන් කතා කිරීම සඳහා දේශීය ඇමතුම් ගාස්තු වැය වේ. ගාස්තු දුරකථන සේවා සපයන්නා අනුව වෙනස් වන අතර ජංගම දුරකථන විසින් වැඩි ගාස්තුවක් අය විය හැක.

**අත්හැර දැමීම**

2016 ජුනි වන විට මෙම තොරතුරු නිවැරදි විය. එම දිනෙන් පසුව ඔබ මෙම ප්‍රකාශනය භාවිතා කරයි නම්, විස්තර නිවැරදිදැයි අප වෙතින් පරීක්ෂා කරන්න.

Australian Government
Department of Human Services

# Status Resolution Support Services (SRSS) payment—Reporting your income

If you or your partner have started working you will need to let us know **immediately**. This is because what you and your partner earn affects your SRSS payments.

We need to know what you have earned each fortnight, so you are paid the right amount. If you are overpaid an SRSS payment, you will have to pay the money back.

**What do I need to report?**
Income from employment:

- gross income from salary, wages and/or commission, including sick pay, carer's leave or holiday pay.

Income from other sources:

- gifts or allowances of a regular nature
- income from a deceased estate
- sickness or accident insurance.

**What do we need to know?**
When reporting yours and your partner's income, we need to know:

- the gross income amount—the amount earned before tax during your reporting period (14 days)
- your employer's details—including their business name, address, phone number and Australian Business Number (ABN) if known. You will find your employer's ABN on your payslip, or you can ask your employer
- the date you started work.

You must report yours and your partner's income for the entire 14 days of your reporting period, including the first and last days, even if you haven't yet been paid by your employer. Remember, not everyone reports on the same day, so some customers may have a different reporting period to you.

**When do I report?**
You must tell us **immediately** if you and/or your partner get a job, stop working or your income changes.

Once you start work you need to report your income the day BEFORE your SRSS pay day every two weeks.

**How do I report my income?**
By phone:

- on the day BEFORE your SRSS payday, call **131 202** and say "SRSS" **when asked for your language**. You can speak to someone in your language by calling this number.

In person:

- on the day BEFORE your SRSS payday you can complete and lodge an Income Reporting Statement form by visiting a service centre to speak with a Service Officer. Many service centres have interpreters or bilingual staff, or a telephone interpreter can be arranged.

**What if I am self-employed?**

- You will be given a Business Details form (MOD F) to complete and return.
- You need to provide a three month estimate of Profit and Loss, either from an accountant or by completing a Profit and Loss Statement form (SU580).
- We will assess your profit and loss and establish your average fortnightly profit.
- We will assess your profit and loss every three months until you have an income tax return that represents the full financial year of trading.

**Who can report your income?**

- You, or your partner.
- You may have another person such as your Service Provider contact us on your behalf.

**Remember** it is your responsibility to report your earnings correctly every fortnight in order to avoid an overpayment.

## For more information

- go to **humanservices.gov.au/srss** for more information in English
- go to **humanservices.gov.au/yourlanguage** where you can read, listen to or watch videos with information in your language
- call **131 202** to speak with us in your language about Centrelink payments and services
- call the Translating and Interpreting Service (TIS National) on **131 450** to speak with us in your language about Medicare and Child Support payments and services
- visit a service centre

**Note:** call costs from your home phone to a ‘13’ number from anywhere in Australia are the cost of a local call. Charges may vary depending on the telephone service provider, and mobiles may incur a higher charge.

## Disclaimer

This information is accurate as at June 2016. If you use this publication after that date, please check with us that the details are current.